00242

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය

විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - සෞන්දර්ය හා නිර්මාණාත්මක කලාව - EPU3234

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.01.14 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

I වන කොටස

01. සෞන්දර්ය යන්න ඔබේ වචනයෙන් අර්ථ දක්වන්න.

02. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පෙර පාසල් පන්තිකාමරයට කෙතරම් බලපෑමක් කරන්නේ ද යන්න සුදුසු උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී ගුරුවරයා විසින් සැළකිලිමත් වියයුතු කරුණු පහක් (05) දක්වන්න.

04. පෙරපාසල් අධ්‍යාපනයේ දී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නාට්‍යමය ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ වැදගත්කම සුදුසු උදාහරණයක් ඇසුරින් විස්තර කරන්න.

05. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකි ඉවතලන ද්‍රව්‍ය පහක් (05) නම් කරන්න.

06. පෙරපාසල් ක්‍රියාකාරකම් සඳහා කවි හා ගීත යොදා ගැනීම මගින් දරුවාගේ චිත්තවේගී සංවර්ධනයට ඇතිවන බලපෑම කෙටියෙන් විස්තර කරන්න.

07. ළමා චිත්‍රවල ප්‍රධාන අවධි නම් කරන්න.

08. පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපනය තුළ එළිමහන් ඉගෙනුම් පරිසරයක් යොදා ගැනීම මගින් අත්කර ගත හැකි වාසි පහක් (05) දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. බහුවිධ බුද්ධි න්‍යාය මගින් හඳුන්වා දෙන බුද්ධි වර්ග අට **(08)** නම් කරන්න. (ලකුණු 08)

ii. බහුවිධ බුද්ධි න්‍යායේ පෙන්වා දෙන එක් **(01)** බුද්ධි වර්ගයක් තෝරාගෙන එය කෙතෙක් දුරට දරුවාගේ වැඩීම හා සංවර්ධනයට බලපෑමක් කරන්නේ ද යන්න උදාහරණයක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. i. සංගීතමය හා රිද්මයානුකූල චලන ඔස්සේ දියුණු වන චතුර්විධ කුසලතා නම් කරන්න. (ලකුණු 05)

ii. පෙරපාසල් හා ප්‍රාථමික පන්තිකාමරය තුළ ආකර්ෂණීය හා ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සංගීතය හා රිද්මයානුකූල චලන යොදා ගත හැකි ආකාරය සුදුසු ක්‍රියාකාරකමක් උදාහරණ ලෙස දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

11. i. නාට්‍යානුසාරීව කතන්දර කීම මගින් ඉගැන්වීමේ දී ගුරුවරුන්ට අත්වන වාසි පහක් **(05)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

ii. නාට්‍යානුසාරී ඉගැන්වීම් ආකෘතියක් තෝරාගෙන එම ආකෘතිය භාවිත කරමින් පෙරපාසල් දරුවන් සඳහා උචිත ක්‍රියාකාරකමක් සිදුකරන ආකාරය පියවර වශයෙන් දක්වා ඔවුන් සඳහා එම ආකෘතියෙහි ඇති යෝග්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 15)

12. i. පෙරපාසල් පන්ති කාමරය තුළ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකි සංගීත භාණ්ඩ පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

ii. "පෙරපාසල් දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයට සෞන්දර්යාත්මක හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් ප්‍රබල බලපෑමක් සිදු කරයි." සාකච්ඡා කරන්න. (ලකුණු 15)

13. i. පෙරපාසල් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා රූකඩ භාවිතයේ ඇති වැදගත්කම කරුණු පහක් **(05)** මගින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

ii. ඉගෙනුම් උපකරණයක් ලෙස පෙරපාසල තුළ රූකඩ යොදා ගත හැකි ආකාරය දැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරකමක් ගොඩනගන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.